සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර ඇගයීම - 2018
**Second Term Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 6 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම : - ..........................................................................  විභාග අංකය : - .................................

I කොටස

- ❖ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ❖ පළමු කොටසට ලකුණු 40 කි.

- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1) මස මානවක ඇතුළු පිරිසට යහපත් වැඩ සඳහා උදව් නොකළ කාන්තාව වන්නේ,
   i. සුධර්මා ය  iii. සුජාතා ය
   ii. චිත්‍රා ය  iv. නන්දා ය

2) ඔබ කරන යම් ක්‍රියාවක් කුසල ක්‍රියාවක් ද? අකුසල ක්‍රියාවක් ද? යැ'යි හඳුනා ගැනීමට යොදාගත හැකි ක්‍රමවේදයක් ඇතුළත් සූත්‍රයක් වන්නේ,
   i. සිගාලෝවාද සූත්‍රයයි  iii. රතන සූත්‍රයයි
   ii. අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයයි  iv. මංගල සූත්‍රයයි

3) පන්සලට ගිය ඔබ විසින් පූජණිය වස්තු වන්දනය කළයුතු නිවැරදි අනුපිළිවෙල වන්නේ,
   i. බෝධීන් වහන්සේ, වෙහෙර වහන්සේ, බුදුපිළිම වහන්සේ
   ii. බුදුපිළිම වහන්සේ, වෙහෙර වහන්සේ, බෝධීන් වහන්සේ
   iii. වෙහෙර වහන්සේ, බුදුපිළිම වහන්සේ , බෝධීන් වහන්සේ
   iv. වෙහෙර වහන්සේ, බෝධීන් වහන්සේ, බුදුපිළිම වහන්සේ

4) බෝසතුන් මව්කුස පිළිසිඳ ගනු ලැබුවේ,
   i. වෙසක් පුන් පොහෝ දිනක දී ය.  iii. පොසොන් පොහෝ දිනක දී ය.
   ii. ඇසල පුන් පොහෝ දිනක දී ය.  iv. දුරුතු පුන් පොහෝ දිනක දී ය.

5) සීල ශික්ෂාවට අයත් නොවන්නකි.

i. සම්මා වාචා　　　　　iii. සම්මා දිට්ඨිය

ii. සම්මා කම්මන්ත　　　　iv. සම්මා ආජීවය

❖ පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ සටහන් කරන්න.

6) 'තංච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති
යස්ස පතීතෝ සුමනෝ - විපාකං පටිසේවති '
බුදුන්වහන්සේ මෙම ගාථාව දේශනා කළේ සුමන නම් මල්කරුවෙක් මුල්කරගෙනය.(　　)

7) සිංහ කොඩියෙහි (ජාතික කොඩියෙහි) බෝපත් සතරින් සංකේතවත් වන්නේ 'සතර සංග්‍රහ වස්තු' ය. (　　)

8) චූල්ල රාහුලෝවාද සූත්‍රය හා සිගාලෝවාද සූත්‍රය යන සූත්‍ර දෙකම රාහුල හිමියන් උදෙසා බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. (　　)

9) "දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය" තුළින් ඉගැන්වෙන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. (　　)

10) අනුන්ට අයහපතක් සිදු වුව ද, තමන්ට යහපතක් වන්නේ නම් එබඳු ක්‍රියා කුසල ක්‍රියා වේ. (　　)

❖ (අ) කොටසෙහි සඳහන් ප්‍රකාශවලට ගැළපෙන පිළිතුර (ආ) කොටසින් තෝරා ඉරකින් යා කරන්න.

| (අ) | (ආ) |
|---|---|
| 11) සිල්වත් වීමේ ආනිසංසයකි | i. පවින් වැලැක්වීම. |
| 12) චාරිත්‍ර ශීලයට අයත් වේ | ii. මහත් වූ භෝග සම්පත් ලැබීම. |
| 13) දෙමව්පියන්ගෙන් දරුවන්ට ඉටුවිය යුතු යුතුකමකි.(සිගාලෝවාද සූත්‍රය) | iii. කළ යුතු යහපත් දේ කිරීම. |
| 14) සම්මා කම්මන්තය | iv. දරුවන්ගේ දියුණුව දැක සතුටු වීමේ ගුණය |
| 15) මුදිතාව | v. ප්‍රාණඝාතයෙන් වැළකීම. |

❖ නිවැරදි පිළිතුර හිස්තැනෙහි ලියන්න.

16) සිදුහත් තවුසා සත්‍ය සොයාගෙන පළමුවෙන් ම ගියේ ................................. නම් තවුසා වෙත ය.

17) මහාමායා දේවියගේ උපන් නගරය ........................... නුවරයි.

18) වප් මඟුල් දා බෝසත් කුමරු වැඩූ භාවනාව වන්නේ .................................. භාවනාවයි.

19) ත්‍රිවිද්‍යාව අතුරෙන් ‘පෙර අත්බව සිහි කරන නුවණ’ ............................................. නමින් හැඳින්වේ.

20) “බුදුබව ලබා පළමුව මගේ රාජ්‍යයට වඩින්නයැ’යි සිදුහත් තවුසාගෙන් ඉල්ලා සිටියේ, ............................... රජතුමා ය.

(ලකුණු : 2 **X 20 = 40)**

## II කොටස

1) දෙවන වාරටය නියමිත "ක්ෂණික කථාවක්" යන මාතෘකාව යටතේ ඇගයීමට අදාළව පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ක්ෂණික කථා වාරයේ දී ඔබට ලැබුණු මාතෘකාව කුමක් ද?

ii. මෙම පැවරුමේ දී ගුරුතුමා /තුමියගෙන් ඔබට ලැබුණු උපදෙස් දෙකක් ලියන්න.

iii. ඔබ ඉදිරිපත් කළ කථාවේ කරුණු දෙකක් ලියන්න.

iv. මෙහි දී ඔබ මුහුණ දුන් ගැටලු දෙකක් ලියන්න.

v. ඔබට මෙහි දී ලැබුණු ප්‍රයෝජන දෙකක් ලියන්න.

vi. රටක අනන්‍යතාවය ලොවට පෙන්වන ප්‍රධාන සංකේතය කුමක් ද?

vii. ජයග්‍රහණය කරා යන ගමනේ දී බුදු දහම පෙන්වා දෙන කරුණු දෙකක් ලියන්න.

viii. නාගස් සෙවණේ දී බුදු බවට පත්වූ බුදුරජාණන් වහන්සේලා දෙනමක් නම් කරන්න.

ix. බුදුරජාණන් වහන්සේගේ සිරිපතුලේ ඇති මංගල ලකුණු ගණන කීය ද?

x. ජාතික කොඩියේ තද රතු පාටින් සහ කහ තීරුවෙන් දැක්වෙන්නේ කුමක් ද?

(ල.2 ×10 = 20)

2)

i. පස්මහ බැලුම්වලින් දෙකක් නම් කරන්න. (ල.02)

ii. සිදුහත් කුමාරෝත්පත්තිය සමඟ සිදු වූ අසිරිමත් සිදුවීම් තුනක් ලියන්න. (ල.03)

iii. සිදුහත් කුමරු මනුලොව ඉපදී සිදු කළ ප්‍රථම උදාන වාක්‍යය මෙසේය.

‘අග්ගෝ හමස්මි ලෝකස්ස - ජෙට්ඨෝ හමස්මි ලෝකස්ස
සෙට්ඨෝ හමස්මි ලෝකස්ස - අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවෝ’

ඉහත ගාථාවේ තේරුම ලියන්න. (ල.05)

3)

i. අසිත තවුසා සිදුහත් කුමරු දැක පළමුව සිනාසී දෙවනුව හැඬුවේ ඇයි? (ල.02)

ii. කිසාගෝතමී ප්‍රකාශ කළ නිබ්බුත පදවල අදහස ලියන්න. (ල.03)

iii. දුකින් මිදීමේ මග සොයා ගිය සිදුහත් තවුසාණන්ට උපස්ථාන කළ තවුසන් පස් දෙනා නම් කරන්න. (ල.05)

4)

i. ත්‍රිවිධ චෛත්‍ය වඳින ගාථාවේ මුල් දෙපදය ලියන්න. (ල.02)

ii. තෙරුවන් නම් කරන්න. (ල.03)

iii. පන්සිල් පද පහේ තේරුම ලියන්න. (ල.05)

5)

i. රාහුල හිමියන් රහත් ඵලයට පත්වූයේ කුමන සූත්‍ර දේශනාව ශ්‍රවණය කිරීමෙන් ද? (ල.02)

ii. රාහුල හිමිගේ චරිතයෙන් අපට ගතහැකි ආදර්ශ තුනක් ලියන්න. (ල.03)

iii. රාහුල හිමියන්ගේ චරිතාදර්ශ සිසු ජීවිතයට එක්කර ගැනීමෙන් සිසුන්ට අත්වන වාසි 5ක් ලියන්න. (ල.05)

6)

i. මෙත්තා හෙවත් මෛත්‍රිය යනු කුමක්ද? (ල.02)

ii. සිව් බඹ විහරණයන්ගෙන් තුනක් නම් කරන්න. (ල.03)

iii. මඝ මානවක විසින් ආරක්ෂා කළ උතුම් වත් හතෙන් පහක් ලියන්න. (ල.05)

7)

i. පන්සිය පනස් ජාතක පොතෙහි ඇතුළත් "දියුණුවේ දොරටු" යන තේරුම ඇති ජාතක කථාව නම් කරන්න. (ල.02)

ii. එම කථාවේ සඳහන් දියුණුවේ දොරටු අතරින් "වුද්ධානුමතං","සුතං", "අලීනතා" යන වචනවල තේරුම් ලියන්න. (ල.03)

iii. නීරෝගී බව රැකගැනීම සඳහා ඔබ විසින් කළ යුතු දේවල් 5ක් ලියන්න. (ල.05)